උතුම් අවස්ථාව අහිමිවීමට ප්‍රධානම හේතුව....,

# "අපිට නම් ප්‍රශ්ණයක් වෙන එකක් නැහැ"

යනුවෙන් මුලාවී..., පෙනෙනා යථාර්ථය බැහැර කිරීමයි.

එමනිසා ගිහි පැවිදි ස්ත්‍රී පුරුෂ හැමදෙනා මේ කරුණු පස නිරතුරු නුවණින් විමසිය යුතුය..,

## මම වයසට යනවා. වයසට යෑම ඉක්මවා නැත...

## මට ඕනෑම ලෙඩක් වැලදීමට ඉඩ ඇත. ලෙඩ වීම ඉක්මවා නැත...

## මම කුමන හෝ මොහොතක මරණයට පත්වනු ඇත. මරණය ඉක්මවා නැත...

## මාගේ සියලුම ප්‍රිය මනාප අය හා දේවල් නොයෙක් ආකාරයට වෙනස්වී විනාසවේ..

## මා කර්මය පිහිට කොට ඇත. යම් හොඳ හෝ පාපීවූ කර්මයක් කරයිද එයම දායාද වේ

## එකාන්තයෙන්ම මෙය මට පමණක් සිදුවන්නක් නොව සියලු සත්වයන්ටම සිදුවන්නකි...

මෙසේ නුවණින් විමසන්නාගේ තරුණ මදය, ආරෝග්‍ය මදය, ජීවිත මදය, දුරුවේ; ඡන්ද රාගය දුරුවේ; කායික, වාචසික, මානසික, දුසිරිත් දුරුවේ...

## ඔහු ආර්‍ය මාර්ගයට පැමිණෙයි, එය ඇසුරු කරයි, භාවිතා කරයි, බොහෝසේ පුරුදු කරයි...

## මෙසේ කරන්නා වූ ඔහුගේ සංයෝජන ප්‍රහාණය වේ, කෙලෙස් දුරුවේ...

ඨාන සූත්‍රය ඇසුරෙනි...